# ඈ . ..



ලිව්නි රඹුක්වැල්ල



978-624-208-845-7

# පිදුම

**මෙම පොත මාගේ**

**දෙමාපියන්ටත්,මට නැණ**

**නුවණ ලබා දෙන**

**ගුරුවරුන්ටත් ආදරයෙන්,**

**ගෞරවයෙන් පුද කරමි!**

978-624-208-845-7

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# 01.

සෑම අයෙකුටම තමන්ගේ **පවුල** යනු තමා වෙන්වෙන් ඕනෑම වෙලාවක ඕනෑම දෙයකට තමන් සමග සිටින එකම පුද්ගල කණ්ඩායමක් වේ.

මිනිසුන් වශයෙන් අප සියලු දෙනාටම ආදර,රැකවරණය,ආරක්ෂාව නොමැතිව මෙලොව ජීවත් වීම අපහසු වේ.විශේෂයෙන්ම කාන්තාවන් හට රැකවරණය යනු ඉතාමත් අත්‍යාවශ්‍ය දෙයකි . ගැහැනු ළමයෙකුට පළමුව රැකවරණ ලැබෙන්නේ තමාගේ පවුලෙනි පවුලෙන් ලැබෙන්නා වූ රැකවරණය

වෙනත් කිසිදු ස්ථානයකින් ලබා ගත නොහැකිය.

## නිරීතා සෙවස්වි රාජසේන

මැය ඉතාමත් රූමත් ප්‍රියජනක තරුණ යොවුන් වියට පා තැබූ ගැහැනු ලමයෙක් විය.මැයගේ පවුලේ අම්මා,තාත්තා,බාල සහෝදරයා හා මිත්ත්‍රියගෙන් යුත් ඉතාමත් සතුටින් කාලය ගත කරන පවුලකි. ගමේ පාසලේ පවා නිරීතා හැම කෙනෙකුගේම ප්‍රසාදයට ලක් වූ තරුණියක් වූවේය.පාසලේදී පවා ක්‍රීඩා අංශයෙන්,නර්තන අංශයන්ද පාසල් ශිෂ්‍ය බට කණ්ඩායම වැනි අංශ ගණනාවකින් මැය ජයග්‍රහණය කර මනා දස්කම්

පෙන්නමින් පාසලට කීර්තියක් අත්පත් කර දුන්නේය.

බාහිර වැඩ බොහෝමයක් කරන මැය තමාගේ අධ්‍යාපනද ඉතා හොඳින් කර ගත්තේය.සෑම විෂයට පාසා වැඩි ලකුණු සංඛ්‍යාවක් ගෙන තමාගේ දෙමාපියන් සතුටු කළ තරුණියක් ලෙස සැමොගෙම කීර්තිය මැයට ලැබුනේය.

# 02.

සාමාන්‍ය පෙළ විභාගයට විශිෂ්ට සාමාර්ථ 9ක් සමග කොළඹ උසස් පාසලකටආරධනා ලැබූ මැය තමාගේ පවුලෙන් ඈත් වී කොළඹ යාමට තීරණ කරා.

කොළඹ යනු මැයට අලුත් පරිසරයක් අලුත් මිනිසුන් හා අලුත් මුහුණු ගණනාවක් සමග මැයට මෙය ලොකු අභියෝගයක් විය

ඇය ගමින් කලින් පාසලෙන් ගෙදරින් ගිය පසු සැමෝටම නිරීතා නැති අඩුව බෙහෙවින් දැනිනි. මෙම අලුත් පරිසරයට

පුරුදු වීමට මැයට බොහෝ කල් ගත විය . තමා සෙල්ලම් කරපු ගම අවුරුදු **11**ක් හැදුනු වැඩුනු ගම ඇළදොළ වරින් වර සිහි විය තමගේ සහෝදරයා සමග නිතර රණ්ඩුදබර කරපු අයුරු මේ සියල්ල මැයට නිතර නිතර මතකයට නැගිනි.

නව පාසලේ මිතුරියන් සොයා ගැනීමට නිරීතාට වැඩි කාලක් ගියේ නැත් මොකද මැය සැමොම සමගම හොදින් කතා බහ කරන අයෙකු වූ නිසා නව පාසලේ හොදම මිතුරා වූයේ ලෙසදු මියුරාජ් සතරසේනය. මැය වටා මිතුරන් රැසක් එක් රොක් වී සිටියාත් තමගේ සියලු කරදර සතුට මැයට බෙදා ගත හැකි වූයේ මොහු සමගය මොහු **1** ශ්‍රේණියේ සිට මෙම විද්‍යාලයේ ඉගැනුම ලබපු පාසල හා

ඒ වටපිටාව පිළිබඳ මනා දැනුමක් ඇති තරුණයකු වූවේය.නිරීතා එම ප්‍රදේශය ගැන නොදත් බොහෝ දේ ලෙසදු නිරීතාට කියා දී සෑම විටම පැවසුවේ "මෙහෙ ගෑණු ලමයෙකට රෑ තනියම ඇවිදින්නවත් යන්න බෑ හමවෙලාවෙම මිනිස්සුන්ගෙන් පරිස්සම් වෙන්න "ඒක තමයි ලෙසදුගේ ජාතික වාක්‍ය උනේ ලෙසදුගේ හොඳම යෙහෙළියද වූයේ නිරීතාය.

# 03.

මෙයාල දෙන්න පන්ති යන්නේ පවා එකට ඉතිම් මේක මේයාලගේ ඉස්කොලෙ අනිත් ළමයින්ට ලොකු ප්‍රශ්නයක් උනා ටික කාලෙකට පස්සේ මේ දෙන්නගේ යාළු කමට හැමෝම ඉර්ෂයා කරන්න පටන් ගත්ත. මේක නිරීතාගේ ගෙදරට ආරංචි වෙලා නිරීතට නිරීතගේ අම්ම තාත්තා හොදටම බනින්න පටන් ගන්නවා නිරීතට ආපහු ගෙදර එන්න කියනවා නිරීතා තාත්තගේ කීම අහක හෙල්න්න බැරි නිසා ගෙදර යනවා නිරීතට දෙමාපියන් හොදටම බැන වදිනවා.නිරීතා ආපහු පාසලට ය්න්නේ හොද මානසික

මට්ටමකින් නෙවෙයි තමන් කිසිම වරදක් නොකර තමන්ගේ දෙමාපියන් තමාට මේ අයුරින් බැන වැදීම නිරීතාට අදහා ගත නොහැකි වූ දෙයකි.

කලින් තමන්ගේ සියලු වැඩ හොදින් උනන්දුවෙන් සිදු කරපු නිරීතා මෙම ප්‍රශ්නය නිසා බොහෝ සේ මානසිකව වැටුනු තරුණියක් වූවාය.පෙර සති අන්තයේ ගෙදර යාමට ආසාවෙන් බලා සිටි නිරීතාට සති අන්තය කියන්නේ ඉතාමත් කටුක ජීවිතයක් විය නිරීත ටිකෙන් ටික ගෙදර යාම මගහැර නේවාසිකාගාරයේ තනියම හෝ සති අන්තය ගෙවා ගැනීමට තීරණය කරේය. වෙනදාට ගෙදරින් දුරකථන ඇමතුමක් එනකම් බලන් ඉන්න නිරීතාට දැන්

එයටවත් උනන්දුවක් නැත ලෙසදුගේ කීමට අමතර පන්තිවලට පවා මිතුරන්ගේ බලකිරීමෙන් පන්ති කරා ගියද කිසිදු උවමනාවකින් පන්තිවලට නිරීතා ගියේ නැත .මෙය පිළිබඳ ලෙසදු කොතෙක් නිරීතාට කිවද ඇය සෑම විටම ලෙසදුට කීවේ "ඇයි අම්මලා මට බණින්නේ මන් වැරැද්දක් කරේ නෑ නේද" යන වචන කිහිපය විතරක් සෑම විටම ලෙසදුගෙන් ඇසීය.මෙවර වාර විභාගයටද අඩු ලකුණු ගත්බව දැනගත් නිරීතාගේ දෙමාපියන් යළිත් නිරීතාට බැන වැදීමට පටන් ගත්තේයලෙසදු විසින් නිරීතාගේ කැඩුණු හිත කිහිපවරක්ම සැදුව සති අන්තයෙ ගෙදර සිට පාසල එනවිට ආපහු සිටියා වගේම නිරීතා හිත රිද්දාගෙන පාසල්

පැමිණේ නිරීතාට සති අන්තයේ ගෙදරයෑම නවතා ඒ වෙනුවට එම ප්‍රදේශයේ ඇති පන්සල්කට යෑමට ලෙසදූ පුරුදු කලේය මෙය නිරීතාර මහත් සැනසීමක් ලබා දුන්නේය.

# 04.

නිරීතාට සති අන්තයේ ගෙදරයෑම නවතා එ වෙනුවට එම ප්‍රදේශයේ ඇති පන්සල්කට යෑමට ලෙසදු පුරුදු කලේය මෙය නිරීතාර මහත් සැනසීමක් ලබා දුන්නේය.ඊළඟ වාරයේ පෙර සිටි නිරීතා ආපසු ගෙන ඒමට හොදම මිතුරා වූ ලෙසදුට හැකියාව ලැබිනි. ලෙසදගේ මව නිරීතාට ඉතාමත් ප්‍රිය කලේය.උදේ දවල් කෑම එක පවා ලෙසදු අතේ නිරීතා වෙනුවෙන් එවන්න ඇය අමතක කරේ නැත එක් දිනක් ලෙසදුගේ මව විසින් නිරීතාගෙ මවට දුරකථන ඇමතුමක් දී මේ අවුරුද්දේ වූ සියලුම දේ නිරීතාගේ මවට

පැවසීය. නිරීතගේ මවට අදහාගත නොහැකි විය තමන් නිසා හොදින් වැඩ කටයුතු කරගත් තමන්ගේ දියණියට මෙලෙස වෙයි යැයි කියා ඇය කිසිම දිනක සිතන්නට නැතුව ඇත් ඇය හැඩූ කඳුලින් ලෙසදුගේ මව සමග බොහෝ වෙලාවක් කතා කරමින් සිට අවසානයට ඇයට සාමාවෙන්න යැයිද ලෙසදුගේ මවට කීය

මෙය නිරීතාගේ මව පියාටද කී පසු මොවුන් දෙදෙනාම එදින නිරීතා හමු වීමට කොළඹ කරා පිටත්ව ගියේය

ඒ යන විටත් ඇය බොහෝ බියෙන් දෙමාපියන් අසලට ගියේය. නිරීතා පැමිණි විගස ඇයගේ  මව හඬා වැදී"අපිට සමාවෙන්න දුව" යැයි කීපවරක්ම කීය

මෙය නිරීතාට අදහා ගත නොහැකි විය

තමාගේ දෙමාපියන් කෙසේද මේ ඇත්ත නැත්ත දැනගත්තේ යන්න ඇයට ප්‍රෙහේලිකාවක් විය එත් සමගම එතනට ලෙසදු ආවේය.

"අම්මෙ මේ ත..ත..ත..මයි ලෙසදු" "ඔව් අපි මේ පුතාව දන්නවා මේ පුතා නොහිටින්න ඔය ළමයට මොනවා වෙයිද මන් දන්නේ නෑ "ඒ නිරීතාගේ පියාය.

"ගොඩක් ස්තූතී පුතා කරපු මේ හැමදේටම "

"අපි දෙන්න හොදම යාළුවෝ විතරයි ආන්ටි ආන්ටිලා අපේ පන්තියේ ළමයි තේරුම් ගත්ත විදිය ගොඩක් වැරදි හැබැයි ඒමයි කියල එදා අපි දෙන්න තරහ

උනානම් අද ආන්ටිට මේ දුවව
හම්බෙන්නේ නෑ”

තමාගේ දෙමාපියන්ටත් තමාව තෙරුම් ගැනීමට නොහැකි වූ වෙලාවෙහි තමන්ව තේරුම් ගැනීමට මෙවැනි හොඳම මිත්‍රයෙකු සිටීම භාගයකි.

තමන්ව වැරදි මාර්ගයේ යාමට නොදී නිවැරදි මාර්ගයේ එක්කන් යෑමට විශ්වාසනීය කලන මිතුරෙකු අත්‍යවශ්‍යය.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්